**ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**
**--------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්වාගණනය කළ මතය

**--------------------------**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**--------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ගිණුමකරණ ප්‍රතිපත්තිවල ලිඛිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දෙමළ හා ඉංග්‍රීසි පිටපත් 2020 ජූනි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වාර්ෂිකව නිකුත් කරනු ලබන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව බදු නොවන ආදායම් හා වෙනත් ලැබීම් වශයෙන් රු.24,627,933 ක් දක්වා තිබූ නමුත් භාණ්ඩාගාර සටහන් අනුව බදු නොවන ආදායම් හා වෙනත් ලැබීම් රු.25,166,632 ක් බව නිරීක්ෂණය විය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර සටහන් අනුව ආදායම පෙන්විය යුතුය. | මෙම දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක 2003-02-06 සඳහා 2019 වර්ෂයේ ලද මුළු ආදායම රු.24,644,545 ක් වන අතර, ආදායමෙන් ආපසු ගෙවීම රු.16,612 කි. ඒ අනුව ශුද්ධ බදු නොවන ආදායම රු.24,627,933 කි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වශයෙන් රු.734,659,232 ක් දක්වා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශ හා අනෙකුත් තොරතුරු අනුව භාණ්ඩාගාර අග්‍රිම වශයෙන් රු.772,500,000 ක් ලැබී තිබෙන බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු පොත් හා ගිණුම් සාරාංශ භාණ්ඩාගාර සටහන් සමඟ මාසිකව සැසඳීමට කටයුතු කළ යුතුය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කරන ලද ආදායම වන රු.62,159,232 ක මුදල භාණ්ඩාගාරයෙන් ලද අක් මුදලට එකතු කර ගිණුමේ පෙන්වා දී ඇත. ඒ අනුව එම මුදල රු.734,659,232 කි. |
| (ඇ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව අත්තිකාරම් ලැබීම් වශයෙන් රු.46,598,697 ක් දක්වා තිබූ නමුත් භාණ්ඩාගාර සටහන් අනුව අත්තිකාරම් ලැබීම් රු.49,238,854 ක් බව නිරීක්ෂණය විය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර සටහන් අනුව අත්තිකාරම් ලැබීම් පෙන්විය යුතුය. | වෙනත් දෙපාර්තමේන්තු අත්තිකාරම් "බී" ගිණුම වෙත බැර කරන ලද අයිතමයන් වන අතර, මෙය අක් මුදල් ගැලපුම් ගිණුමේ ගලපා ඇත. |
| (ඈ) | අත්තිකාරම් ගෙවීම් වශයෙන් රු.72,542,998 ක් දක්වා තිබූ නමුත් භාණ්ඩාගාර සටහන් අනුව අත්තිකාරම් ගෙවීම් රු.72,825,105 ක් බව නිරීක්ෂණය විය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර සටහන් අනුව අත්තිකාරම් ගෙවීම් පෙන්විය යුතුය. | වෙනත් දෙපාර්තමේන්තු අත්තිකාරම් "බී" ගිණුම වෙත හර කරන ලද අයිතමයන්ගේ එකතුව වන අතර, මෙය අක්මුදල් ගැලපුම් ගිණුමේ ගලපා ඇත. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | බැරකම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරමි. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අභ්‍යන්තර විගණන අංශයේ මූලිකත්වයෙන් හා විගණන කළමනාකරණ කමිටුව හරහා නිරන්තරයෙන් අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් සමාලෝචනයට ලක් කරමි. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) ආඥා පනතෙහි 9(3)(ක),(ග) ඡේද | දමනේයාය උසාවිය අසල ගිරිතලේ අභය භූමියට කැළිකසළ විශාල ප්‍රමාණයක් බැහැර කර තිබෙන අතර, වනඅලීන් හා අනෙකුත් සතුන් කසල ආහාරයට ගන්නා බව නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුව මේ සඳහා කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි. | ලබා ගෙන ඇති පැළ 600 ක ප්‍රමාණය අදාල භූමිය මත රෝපණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | මෙම ස්ථානයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වීමෙන් මේ වන විට ගස් රෝපණය කර ඇති අතර, ඒ සඳහා ගම්වාසීන්ගේ සහයෝගයද ලැබී ඇත. එබැවින් නීතිමය පියවර ගැනීමක් අවශ්‍ය නොවීය. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 396(ඈ) | නිකුත් කරන ලද නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවන ලද රු.2,794,263 ක් වූ චෙක්පත් 127 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මු.රෙ. 396(ඈ) ප්‍රකාරව කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 103(1) | 2017 වර්ෂයේ ගැල්වේස්ලෑන්ඩ් කඳවුරු බිමෙහි රඳවා තිබූ රු.17,918 ක් වූ වතුර මෝටරය සොරකම් කිරීම හා බඳුළුවෙල අඩවි ආරක්ෂක කාර්යාල පරිශ්‍ර.යේ ගබඩාකර තිබූ විදුලි වැට කණු 688 ක්, ආධාරක කණු 30 ක් සහ මුළු කණු 30 ක් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධයෙන් මු.රෙ 103(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2018 ඔක්තෝම්බර් 17 දිනැති අංක PS/SP/PC/MO/14/ 2018 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලට අයත් ඉඩමෙහි අයිතිය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඇති ගැටළුව නිරවුල් කරගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලට අයත් ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු කර ඇති අතර, අමාත්‍යාංශයේ මැදිහත්වීම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කර එම ගැටළුව නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |
| **(ඈ)** | 2018 දෙසැම්බර් 26 දිනැති අංක 10/2018 දරන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවේ ඇති සියලුම සංචිත වාහන හා නිළධාරීන්ට අනුයුක්ත කළ වාහන මසකට වරක් අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන මාණ්ඩලික නිළධාරියකුගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් පරීක්ෂාවට ලක් කළයුතු බව සඳහන් කළද, එවැනි පරීක්ෂාවක් සිදුනොවන බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අධ්‍යක්ෂ පාලන හා අධ්‍යක්ෂ ඉංජිනේරු ඇතුළු කණ්ඩායමක් 2019 ජනවාරි මස සිට සෑම මාසයකම අහඹු ලෙස වාහන පරීක්ෂා කර ඇත. එම පරීක්ෂණ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට එම කමිටුව වෙත නැවත උපදෙස් ලබා දීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සංචාරක බංගලා 05 ක් වසර 02 ක පමණ කාලයක් අලුත්වැඩියාව සඳහා වසා තැබීම හේතුවෙන් එම සංචාරක බංගලාවල ආදායම අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය. | සංචාරක බංගලා කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | වනජීවීභාරය විසින් හෝටන්තැන්න හා යාල වනෝද්‍යානවල පවත්වාගෙන ගිය ආපනශාලා සඳහා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා හිඟ ගොඩනැගිලි කුලී ආදායම රු.9,300,000 ක් වූ අතර එම මුදල අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ආදායම් කාලීනව අයකර ගත යුතු අතර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2019 | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ඉඩම් ගැටළු හා අධික වර්ෂාව හේතුවෙන් ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකි වීම සහ වැව් ප්‍රතිසංස්කරණය අදාළ කොන්ත්‍රාත්කරුගේ |

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 03 ක සියයට 50 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | | ප්‍රමාදය හා අධික වර්ෂාව ලැබීම මත ප්‍රවේශ මාර්ග අවහිර වීම. |

**2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රජයට අයවිය යුතු මුදල් අයකරගත යුතු ආකාරය දක්වා ඇතත් මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 58 දෙනෙකුගෙන් රු.3,524,852 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබුණි. ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඉන් අවුරුදු 05 ට වැඩි ණය ශේෂය රු.1,098,447 ක් විය. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

**2.4 තැන්පත් ශේෂයන්**

---------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඉදිකිරීම් කොන්ත්‍රාත්වලින් රඳවා ගෙන තිබුණු රු.47,313,910 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 18 ක් සඳහා රු.27,525,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් ඒවා ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ක්‍රියාකාරි සැලැස්ම අනුව කාර්යභාරයන් ඉටු කිරීම සිදු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 22 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | ආරම්භ කරන ලද ව්‍යාපෘති නියමිත කාල සීමාව තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

### 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාදුරුඔය ජාතික උද්‍යානයේ උළුකැටන්ගොඩ වැව හා හැවැම්මේගල වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිළිවෙලින් රු.2,955,970 ක හා රු.4,000,038 ක බදු රහිත මුදලකට 2017 ඔක්තෝම්බර් 31 දින ෂයින් කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් මෙහි වැඩ අවසන් කිරීමකින් තොරව කොන්ත්‍රාත්තුව අතරමග නවතා දමා තිබූ බව නිරීක්ෂණය විය. | අදාළ පාර්ශවයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතුය. | වැව් දෙකෙහි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර නොමැති අතර ප්‍රතිසංස්කරණ කටයුතු නතර කර වසරකට වැඩි කාලයක් ගතව ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.1,343,049 ක් වැයකර මාදුරුඔය ජාතික උද්‍යානයේ ඉදිකරන ලද උණුවතුර බුබුළු කඳවුරුබිම් ගොඩනැගිල්ල 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | මෙම ඉදිකිරීම සඳහා සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම කඳවුරු බිම ඵලදායීව යොදා ගැනීම පිළිබඳව යෝජනා ඇතුළත් වාර්තාවක් උද්‍යාන භාරකරු (මාදුරුඔය) වෙතින් කැඳවා ඇත. |
| (ආ) | 2016 හා 2017 වර්ෂවලදී ඉදිකරන ලද රු.4,020,610 ක් වූ අඹකොළආර සිට කුඩාඔය දක්වා (කි.මී.10.5) හා කඳන් වැව සිට මීගස් වැව දක්වා (කි.මී.10) යන විදුලි වැටවල් දෙක නඩත්තු කර පවත්වාගෙන යාමට සිවිල් ආරක්ෂක බලකායට භාර දී නොතිබුණි. | විදුලි වැට නඩත්තු කර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2015 වර්ෂයේ රු.2,129,335 ක වියදමක් දරා ඉදිකරන ලද ගැල්වේස්ලෑන්ඩ් ජාතික උද්‍යානයේ කඳවුරු බිම 2020 පෙබරවාරි දක්වා සංචාරකයන් සඳහා විවෘත කිරීමකින් තොරව ඌණ උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය. | අදාළ ප්‍රදේශයන් සංචාරකයන් සඳහා විවෘත කිරීමට කටයුතු කළ යුතුය. | භාවිතයට ගැනීම සඳහා කඩිනමින් කටයුතු කරමි. |
| (ඈ) | කැබ් රථයක් රු.1,261,286 ක මුදලකට අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රසම්පාදන අස්තිත්වය විසින් තීරණය කිරීමට ප්‍රථම අදාල රථයෙහි ධාවන තත්වය, මිලටගත් වර්ෂය, වෙළඳපල අගය, අනාගත නඩත්තු පිරිවැය යන සාධක ඇගයීමක් සිදුකර නොතිබුණි. එමෙන්ම | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අලුත්වැඩියාවන් කඩිනමින් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම කැබ් රථය යොදා ගෙන සිදු කරන ලද කසළ බැහැරට ගෙන යාමේ කාර්යයට පමණක් අවධානය යොමු කිරීමේදී ප්‍රසම්පාදන අරමුණ වන මුදලට අගය උපරිමකරණය ඉටු කර ගෙන තිබේ. අලුත්වැඩියාවන් සිදු කිරීම ප්‍රමාදවීමට ප්‍රධාන |

| | | | |
|---|---|---|---|
| | අලුත්වැඩියාවෙහි ආර්ථීක වාසි පිළිබඳව ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 හි සඳහන් පරිදි මුදලට අගය පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. තවද අලුත්වැඩියාව වෙනුවෙන් අවුරුදු 2 යි මාස 8 ක් ගත වී තිබුණි. | | හේතුව යුනයිටඩ් මෝටර්ස් ආයතනය අලුත්වැඩියාවන් ඉතා මන්දගාමීව සිදුකිරීමයි. |
| (ඉ) | 2016 වර්ෂයේදී යාල ජාතික උද්‍යානය සඳහා Ticket Vending machine 02 ක්, Mini PC 03 ක් හා 19"Mini PC Tray 2U 01 ක් රු.2,205,526 කට මිලදී ගෙන තිබුණද 2020 සැප්තැම්බර් දක්වා ඒවා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | යන්ත්‍ර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | අලි වැට කැඩීම අවම කිරීම වෙනුවෙන් විදුලි වැටට සමාන්තරව යෙදීම සඳහා හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට ලබාදී තිබූ රු.321,301 ක වටිනාකමකින් යුත් Concertina Razor Barbed කම්බි රෝල් 43 ක් 2020 සැප්තැම්බර් වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | අවශ්‍යතා හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුය. | කම්බි රෝල් භාවිතයෙන් වන සතුන්ට හානි සිදුවිය හැකි බව අවබෝධ වීම හේතුවෙන් විදුලි වැට සඳහා කම්බි රෝල් යෙදීම නවතා දමන ලද අතර, ඉතිරි කම්බි ප්‍රමාණය කාර්යාල පරිශ්‍රයේ ගබඩා කර ඇත. |

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර කලාපයේ ඉදිකරන ලද විදුලි වැටවල් 07 ක රු.1,546,000 ක් වූ විදුලි උපකරණ සොරා ගෙන | මුදල් රෙගුලාසි වල 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදුකරන බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| | තිබුණද මේ සම්බන්ධයෙන්, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | හානිපාඩු ලේඛනයේ ඇතුළත් කර තිබුණද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවූ අලාභ සංඛ්‍යාව 07 ක් වන අතර, ඒවායේ අලාභයේ වටිනාකම රු.2,857,600 කි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අදාළ වටිනාකම් ඇතුළත් කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.6 කළමනාකරණ දුර්වලතා
---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලාහුගල ජාතික උද්‍යානයේ මායිම් මැනීම හා ව්‍යවස්ථාපිත පිඹුරක් සකස්කර ගැනීම සඳහා 2017 ජූලි 25 දින රු.2,925,600 ක මුදලක් අම්පාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ගෙවා තිබුණි. එහෙත් විගණිත දින වන විටත් එම කටයුතු සිදු කර නොතිබුණි. එසේ තිබියදී මායිම් කණු සිටුවීම සඳහා 2019 ඔක්තෝම්බර් 31 දින පානම ශුස්ත්‍රවළ කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ රු.363,921 ක මුදලකට ගිවිසුම් අත්සන් කර තිබුණි. | මායිම් මැනීමේ කටයුතු සිදුකර අවශ්‍ය මායිම් කණු සිටුවීම සඳහා කටයුතු කළ යුතුය. | 2020 පෙබරවාරි 05 දින සිට 2020 පෙබරවාරි 07 දින දක්වා කාලය තුළදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මිනුම් කටයුතු සිදු කර අවසන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාදුරුඔය ජාතික උද්‍යානයේ ඉද්දපොළ පදවලයාය ප්‍රදේශයේ තේක්ක ගස් 10,000 ක් ඉවත් කිරීම සඳහා 2013 වර්ෂයේ සිට වැඩ ආරම්භ කරගැනීමට තීරණය කර තිබුණද, විගණිත දින වන විටත් ව්‍යාපෘතියට අදාළව අවසන් පාරිසරික ඇගයීම් වාර්තාව සකස් කර නොතිබුණි. | පාරිසරික ඇගයීම් වාර්තාව සකස්කර තේක්ක ගස් ඉවත් කිරීම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. | 2020 ජනවාරි මස මැනීම් කටයුතු අවසන් කර වාර්තාව සකස් කර ඇත. ඒ අනුව දැව සංස්ථාවට අයත් ගස් ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ අලි මරණ 407 ක් වාර්තා වී තිබුණු අතර ඉන් 79 ක් වෙඩිතැබීම් වූ අතර 117 ක් විදුලිය වැදීම හා හක්කපටස් අනතුරුවලින් සිදුවූ මරණ විය. එම තත්ත්වයන් වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මිනිස් ක්‍රියාකාරකම් වලින් වන අලීන් මියයාම පාලනයට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් හඳුනාගෙන තිබුණද ඒවා ළඟා කර ගැනීමට හැකිවන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අරමුණු හා ඉලක්කයන් හඳුනාගෙන ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජ්‍යේෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 14 ක් ඇතුළුව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 867 ක් විය. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |